# පාරම්පරික ගෙඩි වණ පිළිකා වෙදකම

පාරම්පරික වෛද්‍ය ටී.ඒ.ඩී.ඩී. සමරසිංහ

අපගේ පිය පරම්පරාවෙන් පැවත එන නොයෙකුත් ප්‍රතිකාර ක්‍රම අප සතු ව පැවතෙන අතර, මෙම වෙදකමේ ආභාසය මා හට දායාද වූයේ මගේ පියාගෙන්ය.

මෙම වෙදකම උඩරට ගෙඩි වෙදකමෙහි ප්‍රසිද්ධ ව සිටි මධ්‍යම දිසාවේ උඩුනුවරගන්හතේ බස්නායක නිලමෙතුමාගෙන් පැවැතෙන්නකි. තව ද වල්ගම මල්වානේ විසූ සරනේලිස් වෙද මුහන්දිරම් තුමාගෙන් ද, උතුම් වූ ගෙඩි වණ පිළිකා සම්බන්ධ වෙදකම මගේ පියාණන්හට දායාද වී ඇත. පියාණන්ගේ අභාවයෙන් පසු මා විසින් තවදුරටත් උතුම් වූ පාරම්පරික වෘත්තීය පවත්වාගෙන පැමිණ රෝගීන් බොහෝ ප්‍රමාණයක් නිරෝගී භාවයට පත්කරන ලදි. එසේ රෝග සුවපත් කිරීම සඳහා ප්‍රතිකාර කිරීමට පූර්වයෙන් අප තිලෝගුරු බුදුපියාණන්වහන්සේ නැමදීම සහ වෙදහෙදකම් දායාද කළ පියපරම්පරාව සිහිපත්කිරීම ද මා විසින් චාරිත්‍රයක් වශයෙන් සිදුකරනු ලැබේ. අප ජාතියට දායාද වී ඇති උතුම් වූ වෘත්තීය ගැට පබැඳුමෙන් මෙසේය.

ස සොබන තිලෝ අගපත් මුනිඳු නමක ර
සතුටින දෙවන මුනි දෙසූ දහම සිහික ර
නිදොසින තෙවන සිල්වත් සඟන නමක ර
තිසරණ ගුණ සයුර බැස පීනමිනෙ ත ර

සිඳලන විලස ඇත දොස් ම අත පෙමැති ව
යැද සැම දෙවියන්ට පින්දෙමින කැමති ව
සොඳ ගුරුවරුන් සිහිකර නැමද සිතැති ව
පද බැඳ ගෙඩි වණ පිළිකා ගැන කියම් රුවැති ව

ලොව සත හට සැදෙනා පිළිකා නපු රු
දෙවදෑරුම් වේය ඉසිබස් ලෙස මහ රු
පව ලෙස ශරීරෙන් අටගනිති බියක රු
තව ආගන්තුක ව සැදෙන නියම කෙ රු

පදවල දොස් සොයා නොබලා නැතැත්තෙ නි
වෙද උපදෙස් මෙයින් උගනිව් කැමැත්තෙ නි
බිඳ සමතැස් මරහු හැරි තෙ බෙලෙ නි
තද රුදු දොස් නොවී මා දිනේවා සැපෙ නි

ඉස සිට දෙපයට එන ගෙඩිවෙන වෙ න
සාරදහස් හතලිස් අටකැයි දැ න
ඖෂධ පෙර ඉසි පැවසූ විදිමෙ න
දූනගන වෙදකන් කළහොත් සැහෙ න

මරු සුලන් විස කලාව ඇති තැ න
ඖෂධ නොකරන් යන තුරු එතනි න
නොදූන කළොත් ඉන් බොහෝ දොස් සිදුවෙ න
එදූන කරනු පිළියම් සිහියට ගෙ න

**සියලු ගඩු ඉසිරෙන බෙහෙත්**

කැප්පෙටි මයිලද වෙල්ලන්ගිරි නි   ති
රත්කැලද ඇට පඹුරුද ගනි   ති
කහ ලුණුලා කොටමින් මලවා නි   ති
බැන්ද කලට සැම ගඩු වැනසී ය   ති

කයිල දඹල ඕ කුරුඳු පොතුද ගෙ   න
තරණද අන්දර කටුපිල යුෂ ගෙ   න
ඉඟුරු මිරිස් කහ ලුණුලා කොටමි   න
මලවා ගඩු පොඩිවෙන්නට බදු දූ   න

ගල්කුරුද කැට කැල මල්ල පො   තු
වල්කරඹීය සියඹලාය කොළ පො   තු
මෙම යුෂයට පස්කුළු අඹරා යු   තු
යොදා කකාරා ගාපන් ඒ ම   තු

**සියලු ගඩු උදෙසා විශ්මිත ගුණ දෙන තෛල වට්ටෝරුවක්**

රත්නෙටුල් මුල් එ රුක්අත්තන සූරියද රණවරා එරබ   දු
සිත් ලෙසින් පොතු රැගෙන එක්කර එක පමණ කර රැගෙනපි   දු
අත්තනත් දදකීරි කෝමාරිකා පතුක් ඔලිඳ ද සු   දු
ලත් අඟුන කිරි කීකිරිදි මුකුණුවැන්න හැම පරසි   දු

කොටා යුෂ එක වගේ නැලිබාගයක් වන ලෙෂ කකා   රා
ඊට තල නැලියක් යොදා බාගයක් වන ලෙස කකා   රා
දෙදුරු අසමෝද ඉඟුරු මිරිසුද තිපල් දෙක කහ කලඳ අඹ   රා
තෙලට ලා මද ගින්නේ උණුකර තබාගෙන විදි ලෙස පෙ   රා

මෙලෙස ඉස ගල්වමින් තුන්දින නැවත තෙල්හැර පසු එලෙස   ට
නිමල් නැණවත් වෙදුන් කළහොත් එසේ එන ගඩුයාය රට ර   ට
විපුල බලතර කෙසෙරු අත් රැල මැදට පැන වනසා විලස   ට
පතල කර ගඩු නසන ගුණවත් තෙලකි වෙදදුරු නොදෙන් වටපි ට